

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2023

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ 235

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ 235

අන්තර්ගතය

	පිටු අංක
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	3-24
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	25
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	14-38
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	39
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	40-41
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	42-43
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	44-50

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර,නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

1.2 ආයතනයේ දැක්ම , මෙහෙවර, අරමුණු

දැක්ම

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

මෙහෙවර

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

අරමුණ

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ,නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ.

1.3 ප්‍රධාන කාර්යයන්

I. නීතිය සංග්‍රහ ගත කිරීම.
II. නීතියේ විෂමතා නැති කිරීම.
III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.
IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.
V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.
VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.
VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.
VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්,අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්,දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

නීති කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ සමාජිකයන්

I. ජනාධිපති නීතීඥ ඉක්රම් මොහොමඩ් මහතා (සභාපති)
II. ජනාධිපති නීතීඥ පාලිත කුමාරසිංහ මහතා
III. ජනාධිපති නීතීඥ මනෝහාර ද සිල්වා මහතා
IV. ජනාධිපති නීතීඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
V. ජනාධිපති නීතීඥ පාලිත ප්‍රනාන්දු මහතා
VI. ජනාධිපති නීතීඥ අනිල් සිල්වා මහතා
VII. ජනාධිපති නීතීඥ සංජීව ජයවර්ධන මහතා
VIII. ජනාධිපති නීතීඥ වානක ද සිල්වා මහතා
IX. ජනාධිපති නීතීඥ සමන්ත රත්වත්ත මහතා
X. අරිත වික්‍රමනයක මහතා
XI. ප්‍රියන්ති පිරිස් මිය
XII. නාසිමා කමර්ඩීන් මිය
XIII. නිර්මලන් විග්නේශ්වරන් මහතා
XIV. නිරාන් ඇන්කෙටෙල් මහතා

නිලබලයෙන් පත් වූ සාමාජිකයන්:

I. පියුමන්ති පිරිස් මිය, අතිරේක ලේකම් (නීති) / අධිකරණ අමාත්‍යාංශය.
II. ජනාධිපති නීතීඥ පාරින්ද රණසිංහ මහතා
III. දිල්රුක්ෂි සමරසේකර මිය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය:

I. සෙව්වන්දි අබේසේකර මිය,ලේකම් (වැ.බ.) / නීති කොමිෂන් සභාව.

II. ලිලන්ති පතිනාගොඩ මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව.

III. යසාංජී චතුරංගිකා මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව

2023.01.01 සිට 2023.01.31 දක්වා නීති කොමිෂන් සභාවේ නිර්දේශිතයන්ගේ ප්‍රගතිය

1. බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණය

නිර්දේශිතය	බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය
පසුබිම	බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය හා අදාල 2023/Cab Memo/J/L/60 අංක දරන 2023 ජුනි 07 දිනැති කැබිනට් පත්‍රිකාව මගින් අභ්‍යන්තර ආර්ථිකය ශක්තිමත් කිරීමට හා අන්තර්ජාතික ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා වඩා කාර්යක්ෂම බංකොලොත්භාවය පිලිබඳ නීතියක අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. ඒ අනුව වඩා ශක්තිමත් ලෙස බංකොලොත්භාවය පිළිබඳව නීතිය ප්‍රතිසංස්කරණය තුලින් සාර්ථකව පවත්වා ගත නොහැකි ව්‍යාපාරයන් අවසන් කිරීම හා බංකොලොත්භාවයට පත් වුවන් සම්බන්ධව වඩා කාර්යක්ෂම හා වේගවත් ක්‍රියාමාර්ග හා විසඳුම් වලට ප්‍රවිශ්ඨ වීමේ හැකියාව නිරීක්ෂණය විය. ණය ලබා ගැනීමේ ප්‍රවිශ්ඨ වීමේ හැකියාව හා ණය හිමියන්ගේ අවධානම, රැකියාව හා සැපයුම් සබඳතා, ව්‍යවසායකත්ව සංවර්ධනය හා ආර්ථික කාර්යක්ෂමතාවය බංකොලොත්භාවය පිළිබඳ නීතිය ශක්තිමත් කිරීමේහිලා වැදගත් වන සාධක බවට කැබිනට් පත්‍රිකාව මගින් තවදුරටත් අවධාරණය කරන ලදී. තවද දැනට පවතින 1853 බංකොලොත්භාවය පිළිබඳ ආඥා පනත හා 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි බංකොලොත්භාවය පිළිබඳව නීතියේ හිඳැස් හා දුරස්ථභාවයන් කැබිනට් පත්‍රිකාව මගින් හඳුනා ගන්නා ලදී. එම කරුණු සැලකිල්ලට ගනිමින් අන්තර්ජාතික නීතිමය පියවරයන් අනුගත කරමින් වඩා ශක්තිමත් බංකොලොත්භාවය පිළිබඳව නීතියක් යෝජනා කල යුතු බවට කැබිනට් මණ්ඩලය මගින් තීරණය විය. අසාර්ථක ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම හා එවැනි ව්‍යාපාර හඳුනා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම සඳහා නීතිමය හා පරිපාලනමය රාමුවක් සකස් කිරීම තුලින් අන්තර්ජාතික ආයෝජකයින්ගේ අවශ්‍යතාවය සඳහා පසුබිම සැකසීම තුලින් ශක්තිමත් ආර්ථිකයන් ඇතිකිරීමට මග පාදන බව යොජනා විය. කැබිනට් මණ්ඩලය මගින් මෙම ඉහත යෝජනාවන්ට අදාලව අදාල පාර්ශවයන් සමග සාකච්ජා කොට බංකොලොත්භාවයන් පිළිබඳ නව නීති ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට නීති කෝමිෂන් සභාව වෙත යොමුකරන ලදී.
වත්මන් තත්ත්වය	**නීති කොමිෂන් සභාව විසින් බංකොලොත්භාවය පිළිබඳ නීතිය ප්‍රතිසංස්කරණය සඳහා අනුකමිටුවක් පත් කරන ලදී.** ජනාධිපති නීතීඥ වානක ද සිල්වා මහතා - සභාපති ආචාර්ය ජනාධිපති නීතීඥ හර්ෂ කබ්රාල් මහතා ජනාධිපති නීතීඥ පාරින්ද රණසිංහ මහතා නීතීඥ නිරාන් ඇන්කටෙල් මහතා නීතීඥ ෂෙහාරා වීරකෝන් මිය (නීති කෙටුම්පත් සම්පාදක වෙනුවට) **මූලික සාකච්ජා - 08**

	ලෝක බැංකු නියෝජිතයින් සමග මාර්ගස්ථව සාකච්ඡා: දින: 2023.08.17/ 2023.08.23/ 2023.08.09/ 2023.09.05/2023.09.12 පහත කරුණු සාකච්ඡා කරන ලදි. ලංකාවේ බංකොලොත්භාවය පිළිබඳ - ප්‍රධාන ප්‍රතිපත්තිමය සහ නීති කරුණු ප්‍රතිසංස්කරණය අදාළ ප්‍රශ්ණ පෞද්ගලික බංකොලොත්භාවය පිළිබඳ - පර්යේෂණ හා වෙනත් රටවල නීතිමය කරුණු ප්‍රවනතා **අදාල පාර්ශවයන් සමග :** සාකච්ඡා 02 2023.09.12 - ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන් 2023.09.14 - නීති, මුල්‍ය හා බැංකු ක්ෂේත්‍රවල වෘත්තිකයන් සමග **ප්‍රගති සමාලෝචන රැස්වීම්** ජනාධිපති ලේකම් කාර්යාලය - 2023.10.03 ලෝක බැංකු නියෝජිතයින් - 2023.09.25 – 2023.10.06 නීති කොමිෂන් සභා රැස්වීම් - ප්‍රගති සමාලෝචන - 08 යාවත්කාලීන ප්‍රගතිය - බංකොලොත්භාවය පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ කෙටුම්පතක් සකස් කිරීම හා එම කෙටුම්පත පුද්ගලික අධිකරණ හා රජයේ වෘත්තිකයින්ගේ අදහස් හා යෝජනා වලට විවෘත කිරීම.

2. උපකෘත පාසල් හා පුහුණු පාසල් සම්බන්ධ නීතිය පිළිබඳ ප්‍රතිසංස්කරණය

නිර්දේශිතය	උපකෘත පාසල් හා පුහුණු පාසල් සම්බන්ධ නීතිය පිළිබඳ ප්‍රතිසංස්කරණය
පසුබිම	ගරු අධිකරණ අමාත්‍ය ආචාර්ය විජේදාස රාජපක්ෂ මැතිතුමා විසින් MOS/LT/CC–(01)/ 2018 දරන 2023.07.06 දිනැති ලිපිය මගින් නීති කොමිෂන් සභාව වෙත උපකෘත පාසල් හා පුහුණු පාසල් ගුරුවරුන් විසින් යොමු කරන ලද ලිපියක් යොමු කරන ලදී. 01. දැනට ක්‍රියාත්මක වන උපකෘත පාසල් රජයට පවරා ගැනීම හෝ එහි පූර්ණ බලාධිකාරය කලාප අධ්‍යාපන හෝ දිස්ත්‍රික් ලේකම්ට හෝ පැවරීම 02. උපකෘත පාසල් වල ගුරුවරුන්ට වැටුප් හා උසස්වීම් දැනට රජය විසින් සිදුකරනත් බදවා ගැනීම්හි හා ස්ථාන මාරුකිරීම්හි බලය රාජ්‍ය නොවන සංවිධාන වල පරිපාලන මණ්ඩල මගින් සිදුකරනු පෙනේ. එය වළකා බදවා ගැනීම් හා ස්ථාන මාරු කිරීම් ද අධ්‍යාපන අමාත්‍යාංශයේ බලාධිකාරයට පූර්ණ වශයෙන් යටත් කළ අතර, ශ්‍රී ලංකා උපකෘත පාසල් ගුරු සේවය යන්නෙහි, ‘‘උපකෘත පාසල්’’ යන්න ඉවත් කර ‘‘ශ්‍රී ලංකා ගුරු සේවය’’ ලෙස පිළිගැනීම. 03. දැනට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශාල වැය බරක් දරා නඩත්තු කෙරෙන විශේෂ අධ්‍යාපන ඒකක වල විශේෂඥතාවන්ගේ ප්‍රතිලාභ ශ්‍රව්‍ය, දෘශ්‍ය හා මානසික ඌනතා වලින් පෙළෙන ළමුන්ට ලබාදීම සඳහා ක්‍රමෝපායික වෙනස්කම් සිදුකළ යුතුය. මේ සඳහා උපකෘත පාසල් වල ගුරුවරුන් යාවත්කාලීනව සංවර්ධනය, සැසි පැවැත්වීම, විෂය අන්තර්ගතයේ අධික්ෂණය අධ්‍යාපන කලාප කාර්යාල වල විශේෂ අධ්‍යාපන ඒකක වලට පැවැරිය හැකිය. 04. ලෝකයේ දියුණු රටවල ශ්‍රව්‍ය, දෘශ්‍ය හා මානසික ඌනතා සහිත ළමුන් අධ්‍යාපනය ලබන්නේ සාමාන්‍ය පාසලේය. ඉන් ඔවුන්ගේ පෞරුෂය සම්පූර්ණ වේ. අප රටට එකවර එතැනට යා නොහැකි නිසා අතරමැද පියවරක් ලෙස සාමාන්‍ය පාසලේ ශිෂ්‍යයන් හා බැදී සමෝධානික විෂය ක්ෂේත්‍රයක් හා කාල රාමුවක් හදුන්වා දිය යුතුය. යම් යම් විෂයන්ට අදාළ පාඩම්, ශිෂ්‍ය ක්‍රියාකාරකම් සාමාන්‍ය පාසලක ගුරුවරුන්ගේ පන්ති කාමරය හා එක් කොට සිදු කිරීමට අවකාශ ලබා දීම, ක්‍රීඩා උත්සව, විවිධ ප්‍රසංග, සාහිත්‍ය සමිති නව නිර්මාණශීලී කව හා අත්කම් සාමාන්‍ය පාසල් දරුවන් හා එක්ව සිදු කිරීමට අවස්ථාව ලබා දීම. 05. දැනට සිසුන් අඩුවීම නිසා වැසී යන පාසල් හෝ ගොඩනැගිලි, ක්‍රීඩා පිටි පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මත නොවන පාසල් හෝ භාවිතයට ගෙන නව විශේෂ අවශ්‍යතා පාසල් ආරම්භ කිරීම. 06. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ උපාධි, පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා විද්‍යාර්ථයින් බිහිකිරීමට අවශ්‍ය අනුබලය ලබා දීම. **නීති කොමිෂන් සභාව විසින් අනු කමිටුවක් පත් කරන ලදී.** මහාචාර්ය නාසීමා කමාර්ඩීන් මිය - සභාපති ජනාධිපති නීතිඥ චානක ද සිල්වා මහතා නීතීඥ ෂෙහාරා වීරකෝන් මිය (නීති කෙටුම්පත් සම්පාදක වෙනුවට)

වත්මන් තත්ත්වය	උක්ත කාරණය හා අදාල වන ලේඛණ හා නීති සලකා බලන ලදී. ඒ අනුව උපකෘත පාසල් ගණයට අදාල වන පාසල් ඉතා සුළු ප්‍රමාණයක් පවතින බවත් ඒවායින් බොහෝමයක් ආගමික සංවිධාන මගින් පවත්වා ගෙන යන බවත් නිරීක්ෂණය කරන ලදී, ඇතැම් පාසල් මෑතකදී පුර්ණ ලෙස පෞද්ගලිකරණය කරනු ලැබ ඇත. ඊට හේතු වී ඇත්තේ ගුරුවරුන්ගේ වැටුප් ලබාදීම රාජ්‍ය අංශයෙන් බෝහෝ සේ ප්‍රමාද වීමයි. (උදා: මෙතෝදිස්ත විද්‍යාලය) ගුරු වෘත්තිය සමිති මෙම පාසල් වල පාලනය රජය යටතට ගැනීම පිළිබඳ කැමැත්ත පලකල ද බොහෝ පාසල් පුර්ණ ලෙස පෞද්ගලිකරණය වී ඇති බැවින් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇත. මේ අනුව අනු කමිටුව විසින් අදාල පාර්ශවයන් සමග සාකච්ජාවන් පැවැත්වීමට අදහස් කරන ලදී. අනු කමිටු රැස්වීම් - 02 අඅදාල පාර්ශවයන් සමග සාකච්ජා - 01 නීති කොමිෂන් සභා රැස්වීම් : 06 (ප්‍රගති සමාලෝචනය) යාවත්කාලීන ප්‍රගතිය : නීති කොමිෂන් සභාව විසින් අනුකමිටු වාර්තාව 2023.12.02 දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදි අවසානාත්මකව අනුමත කොට ගරු අධිකරණ අමාත්‍යතුමා හා අධිකරණ අමාතයාංශයේ ලේකම්තුමා වෙත යොමු කරන ලදී.

උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල සඳහා අදාළ නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන්වූ අනු-කමිටුවේ වාර්තාව.

වෙත:- සභාපති, ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව.
දිනය:- 2023 ඔක්තෝබර් 26 වැනිදා.

1. **පසුබිම සහ ආරම්භක අදහස:**

අධිකරණ අමාත්‍යාංශය විසින් 2023 ජූලි 10 දිනැති ලිපිය මගින් උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල සම්බන්ධයෙන් වන නීතිය පරීක්ෂා කර බලා එකී නීතිය ප්‍රතිසංස්කරණය සඳහා යම් යෝජනා තිබේනම් වාර්තාවක් මගින් ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. අමරා දිසානායක විසින් ශ්‍රී ලංකා උපකෘත පාඨශාලා ගුරු සේවයට අයත් තැනැත්තන් කීපදෙනෙකුගේද අත්සන් සහිතව අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලද 2023.06.29 දිනැති ලිපිය මත පදනම්ව ඉල්ලීම සිදු කරන ලදී. උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල සම්බන්ධයෙන් වන නීතිය යල් පැන ගිය එමෙන්ම සමාජයේ අවශ්‍යතා සඳහා තවදුරටත් දායක නොවන බවට එකී ලිපියේ දෝෂාරෝපණයට ලක්කොට තිබුණි.
ඒ අනුව, පහත නම් සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත අනු-කමිටුවක් එම කරුණ අධ්‍යනය කිරීමට පත් කරන ලදී: මහාචාර්ය නසීමා කමර්ඩීන්, ජනාධිපති නීතීඥ චානක ද සිල්වා මයා සහ ශෙහාරා වීරකෝන්.
පහත දක්වා ඇති අදාළත්වයක් ඇති අතිරේක කරුණු සහ යෝජනා ඇමුණුම් දෙකෙහි අඩංගු වේ.

<u>ඇමුණුම අංක 1</u>

<u>**ලිපියේ දක්වා තිබූ අදාළත්වයක් ඇති ප්‍රධාන කරුණු.**</u>

1. දැනට ත්‍රියාත්මක වන උපකෘත පාසල් රජයට පවරා ගැනීම හෝ එහි පූර්ණ බලාධිකාරිය කලාප අධ්‍යාපන අධයත්ෂතට හෝ දිස්ත්‍රික් ලේකම්ට හෝ පැවරීම.

2. උපකෘත පාසල්වල ගුරුවරුන්ට වැටුප් හා උසස්වීම් දැනට රජය විසින් සිදුකරනත් බඳවා ගැනීම්හි හා ස්ථාන මාරුකිරීම්හි බලය රාජ්‍ය නොවන සංවිධානවල පරිපාලන මණ්ඩල මගින් සිදුකරනු පෙනේ. එය වලකා බඳවා ගැනීම් හා ස්ථාන මාරු කිරීම්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ බලාධිකාරයට පූර්ණ වශයෙන් යටත් කළ යුතු අතර, ශ්‍රී ලංකා උපකෘත පාසල් ගුරු සේවය යන්නෙහි ‘‘උපකෘත පාසල්’’ යන්න ඉවත් කර ‘‘ශ්‍රී ලංකා ගුරු සේවය’’ ලෙස පිළිගැනීම.

3. දැනට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශාල වැය බරක් දරා නඩත්තු කෙරෙන විශේෂ අධ්‍යාපන ඒකකවල විශේෂඥතාවන්ගේ ප්‍රතිලාභ ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මානසික ඌනතාවලින් පෙලෙන ළමුන්ට ලබාදීම සඳහා ක්‍රමෝපායික වෙනස්කම් සිදුකළ යුතුය. මේ සඳහා උපකෘත පාසල්වල ගුරුවරුන් යාවත්කාලීනව සංවර්ධනය, සැසි පැවැත්වීම, විෂය අන්තර්ගතයේ අධීක්ෂණය අධ්‍යාපන කලාප කාර්යාලවල විශේෂ අධ්‍යාපන ඒකකවලට පැවැරිය හැකිය.

4. ලෝකයේ දියුණු රටවල ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මානසික ඌනතා සහිත ළමුන් අධ්‍යාපනය ලබන්නේ සාමාන්‍ය පාසලේදීය. ඉන් ඔවුන්ගේ පෞරුෂය සම්පූර්ණ වේ. අප රටට එකවර

එතැනට යා නොහැකි නිසා අතර මැද පියවරක් ලෙස සාමාන්‍ය පාසලේ ශිෂ්‍යන් හා බැඳි සමෝධානික විෂය ක්ෂේත්‍රයක් හා කාල රාමුවක් හඳුන්වා දිය යුතුය. යම් යම් විෂයන්ට අදාළ පාඩම්, ශිෂ්‍ය ක්‍රියාකාරකම් සාමාන්‍ය පාසලක ගුරුවරුන්ගේ පන්ති කාමරය හා එක්කොට සිදු කිරීමට අවකාශ ලබා දීම, ක්‍රීඩා උත්සව, විවිධ ප්‍රසංග, සාහිත්‍ය සමිති, නව නිර්මාණශීලී කව හා අත්කම් සාමාන්‍ය පාසල් දරුවන් හා එක්ව සිදු කිරීමට අවස්ථාව ලබාදීම.

5. දැනට සිසුන් අඩුවීම නිසා වැසී යන පාසල් හෝ ගාඩනැගිලි, ක්‍රීඩා පිටි පූර්ණ ධාරිතාවෙන් ක්‍රියාත්මක නොවන පාසල් හෝ භාවිතයට ගෙන නව විශේෂ අවශ්‍යතා පාසල් ආරම්භ කිරීම.

6. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන් සඳහාවූ උපාධි, පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා විද්‍යාර්ථීන් බිහිකිරීමට අවශ්‍ය අනුබලය ලබාදීම.

<u>ඇමුණුම අංක 2</u>

<u>දැනට උපකෘත පාසල්වල පවතින අවනතිය.</u>

1. කවර හෝ තරමේ රාජ්‍ය නොවන සංවිධානයක් අටවාගත් පිරිස් සිය හිතවතුන්, නෑදෑයන් පාලන මණ්ඩලයට යොදා ගනිමින් ශිෂ්‍යන් වෙනුවෙන් ලැබෙන පුන්‍යාධාර හා වෙනත් ලබීම් අත්තනෝමතිකව අධ්‍යාපන අරමුණින් බැහැරව වංචා කිරීම සිදුවේ.

2. බොහෝ උපකෘත පාසල්වල පරිපාලක මණ්ඩලයේ අධ්‍යාපනඥයින් නොවන නිසා හෝ සිටිනා අතලොස්සක් අය වුවද ආත්ම ලාභයට නැඹුරුව ඇති නිසා හෝ නිසි අධ්‍යාපනික සංවර්ධන ප්‍රවේශයකින් ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු නොවේ.

3. ගුරුවරුන් බඳවා ගැනීම පරිපාලක මණ්ඩලයෙන් සිදු කෙරන නිසා සුදුසුම ගුරුවරුන් පත් නොවනු ලැබිය හැකිය. ඥාතිහිතමිත්‍රාදී සංග්‍රහ මත එකී පත්වීම් සිදුවනු පෙනේ.

4. උපකෘත පාසල්වල උන්නතිය වෙනුවෙන් වංචා දූෂණ හෙළි කරමින් ළමා අපචාරයන්ට එරෙහිව සැබෑ ගුරුවරු පද්ධතියේ ක්‍රියාත්මක වූ විට ඊට එරෙහිව දූෂිත විදුහල්පති හා පාලක මණ්ඩලය ක්‍රියා කළ අවස්ථා සුලභය.

5. දැනට උපකෘත පාසල්වල නේවාසික පහසුකම් හා ආහාරපානවල තත්ත්වය සතුටුදායක නොවේ.

6. දැනට පවතින උපකෘත පාසල් සිය අභිමතාර්ථ හා අරමුණින් බැහැරව කටයුතු කරන බවට හොඳම සාක්ෂිය: දෘෂ්‍යාබාධිත, ශ්‍රව්‍යාබාධිත හා මන්දමානසික බොහෝ දරුවන් විශේෂ අධ්‍යාපනයට යොමු නොවී නිවෙස්වලම රැඳී සිටීම.

7. ශ්‍රව්‍ය, දෘෂ්‍ය ආබාධිත සිසුන්ගේ මානසික ශක්තියේ, බුද්ධියේ හා චිත්තවේගවල ඌනතාවක් නැත. වෙනත් රටවල සිසුන් සිය කුසලතා උපරිමව පෙන්වා ඇත. අප රටද එතැනට යා යුතුය.

2. පර්යේෂණයේදී සැලකිය යුතුව තිබූ කරුණු:

පවතින නීති සඳහා යම් ප්‍රතිසංස්කරණයන් අවශ්‍යද යන්න තීරණය කිරීමේදී අනු-කමිටුව විසින් පහත කරුණු අධ්‍යනය කිරීමට තීරණය කරන ලදී.

1. උපකෘත පාසල්වල ගුරුවරුන් තමන්ගේ වත්මන් පාසල්වලින් ස්ථානමාරු ලබාගත නොහැකිවීම හේතුවෙන් ගැටලුවලට මුහුණ දෙනවාද යන වග.

2. ඔවුන්ගේ කාර්යයන් සඳහා මෙම උපකෘත පාසල්වල පහසුකම් ප්‍රමාණවත්ද යන වග.

3. (එවා තිබූ ලිපියේ චෝදනා කර තිබූ පරිදි) මෙම පාසල්වල පරිපාලනයේ වංචා සිදුවේද යන වග.

4. මෙම පාසල්වලට සහභාගීවන විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමුන්ව, සාමාන්‍ය පාසල් පද්ධතියකට සමෝධානික කර සමහර විෂයන් එම සාමාන්ය ළමුන් සමග ඉගෙනීමට අවස්ථාව ලබාදිය යුතුද යන වග.

3. පර්යේෂණ ක්‍රමවේදය:

3.1 අධ්‍යනය කළ වාර්තා එකතුව:-

අදාළ නීති හා රෙගුලාසි කියවීමේ අධ්‍යනයක් සහිත මේස-පාදක පර්යේෂණයකින් පළමු අදියර සමන්විත විය.

උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල සඳහා අදාළ නීති.

<u>නීති හා රෙගුලාසි ලයිස්තුව</u>

1. 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත.
2. 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත.
3. 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත.

නීති හා රෙගුලාසි මත පදනම්ව සොයාගත් දැ:

එම පාසල්වල පරිපාලනයේ යෝග්‍යතාව හා කාර්යක්ෂමතාව වළකනු ලබන මෙම නීතීන්ගේ දෘශ්‍යමාන වන එවැනි අඩුපාඩු නොමැති බව මෙම නීති රෙගුලාසි අධ්‍යනය කිරීමෙන් පසු අනු-කමිටුව විසින් නිගමනය කරන ලදී. එමනිසා, උපකෘත පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් සම්මුඛ සාකච්ඡාවකට කැඳවීමට අනු-කමිටුව විසින් තීරණය කර ඔවුන්ට Zoom තාක්ෂණය මගින් රැස්වීමකට ආරාධනා කරන ලදී.

3.2 සම්බන්ධිත පාර්ශ්වයන් සමග සම්මුඛ සාකච්ඡා:

අදාළ සම්බන්ධිත පාර්ෂ්වයන් හට ඔක්තෝබර් මස 12 වන දින ප.ව. 2 ට අතත්‍ය රැස්වීමකට සහභාගී වන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ආරාධනාවක් කරන ලදී. විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් දොළොස් දෙනෙකු පමණ මෙම රැස්වීමට සහභාගී වුණි.

රැස්වීමේදී පහත කරුණු අවධානයට ලක්වීය:

- මුල් ලිපියෙන් සැලකිල්ලට මතු කර ඇත්තේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ එම අවශ්‍යතා ඉටුකරන පාසල් සම්බන්ධයෙන් පමණක් වන කරුණු වූ අතර ඒවා සියළුම උපකෘත පාසල් (අර්ධ-රජයේ පාසල්) සඳහා අදාළ නොවන බව.

- එම පාසල්වල ගුරුවරුන්ව පාසලේ අවශ්‍යතා සහ එම ගුරුභවතාගේ පළපුරුද්ද පදනම් කොටගෙන බඳවා ගනු ලබන්නේ එම පාසල මගින්ම එම පාසලටම විශේෂකොටගනය. මෙම ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් නොවන නිසා ඔවුන්ට ස්ථාන මාරු සඳහා පහසුකම් නොමැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස විවාහය හේතුවෙන් හෝ වෙනත් සලකාබැලීම් හේතුවෙන් වෙනත් දිස්ත්‍රික්කයකට හෝ වෙනත් ප්‍රදේශයකට පදිංචිය වෙනස් කිරීමට අපේක්ෂා කරන ගුරුවරුන්ට එසේ පදිංචිය වෙනස් කිරීමකට හෝ ස්ථාන මාරු නොමැතිකමින් ගුරු වෘත්තිය අඛන්ඩව කරගෙන යාමකට හෝ හැකියාවක් නොමැත.

    - පත්වීම භාර ගන්නා අවස්ථාවේදී මෙම තත්ත්වය පිළිබඳ ඔවුන් දැනුවත්ව සිටියේද යන්න විමසනු ලැබූ විටදී, ඔවුන් දැනුවත්ව සිටි බව පිළිගනු ලැබුවත් එය ඔවුන්ගේ වෘත්තීය අපේක්ෂාව අපහසු කරන බව ඔවුන් කියා සිටින ලදී.

    - ඔවුන්ට ස්ථාන මාරු සඳහා සමාන කළ හැකි යම් පාසල් තිබේදැයි අනු-කමිටුව විමසීමේදී, විකල්පයන් සීමා සහිත බව පෙනී ගිය අතර අවම වශයෙන් සුහද මාරු සඳහාවත් විකල්පයක් පවතී නම් මහත් අත්වැසිල්ලක් බව අවධානයට ලක්විය.

    - එක් විදුහල්පතිනියක්ද මෙම අදහස සමග එකඟවූයේ, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සහ බඳවා ගැනීම් මත සේවය පවත්වාගෙන යාමට මය බාධකයක් බව ප්‍රකාශ කරමින්ය.

- මෙම උපකෘත පාසල්වල පහසුකම් සම්බන්ධව විමසූ විටදී ප්‍රමාණවත් පහසුකම් පවතින බවට එම පාසල්වලින් සහභාගීවූ තැනැත්තන් ප්‍රකාශ කර සිටින ලදී. කොවිඩ් සමයේදී ප්‍රතිපාදනවල පහළ වැටීමක් සිදුවුවද වර්තමානයේදී එවැනි තත්ත්වයක් නොමැති බවත් ඔවුන් අවධාරණය කරන ලදී. කොවිඩ්වලින් පසුව ඇතිවූ ආර්ථික අපහසුතා හේතුවෙන් ගෙවීමට නියමිත අඩු කළ ගාස්තු පවා දෙමාපියන්ට දැරීමට අපහසු වී ඇති බැවින් මෙම පාසල්වල ළමුන් සංඛ්‍යාවේ පහළ වැටීමක් සිදුවූ බවද ඔවුන් විසින් පෙන්වා දෙන ලදී.

- (යොමු කරන ලද ලිපියේ දෝෂාරෝපණය කර තිබූ පරිදි) මෙම පාසල්වල පරිපාලනයේ දූෂණ ඇති බවට සහභාගීවූ කිසිඳු පුද්ගලයකු විසින් ප්‍රකාශ කරන නොලදී. එම ලිපිය අත්සන් තැබූ කිසිවකුවත් රැස්වීමට සහභාගී නොවීමද අවධානයට ලක්වුණි. එමනිසා, මෙම මතය නිශ්චිතව දැන ගැනීම කළ නොහැක.

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මෙම පාසල්වලට යොමු කරවිය යුතුද, ඔවුන්ව සාමාන්‍ය පාසල් ජාලයට එකතු කර එම දරුවන් සමග සමහර විෂයන් ඉගෙන ගැනීමට ඉඩ සැලසිය යුතුද යන

ප්‍රශ්නයට චිත්‍රා පටුමගේ පාසලේ විදුහල්පති විසින් ප්‍රකාශ කර සිටියේ අවම ඉගෙනුම් අභියෝග ඇති දුරුවන්ව සාමාන්‍ය පද්ධතියට දැනටමත් යොමු කර ඇති බවත් මෙම උපකෘත පාසල් විසින් බරපතල අභියෝග ඇති දරුවන්ගේ අවශ්‍යතා පමණක් සපුරාලන බවත් එවැනි දරුවන් සඳහා සාමාන්‍ය පාසල්වලින් උපකාරයක් නොලැබෙන බවත්ය.

4. මූලික සොයාගැනීම්:

අවසානයේදී අනු-කමිටුව පහත දක්වා ඇති සොයාගැනීම් කරා එළඹුණි.

1. විශේෂ අධ්‍යාපන අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ අවශ්‍යතා ඉටු කරන උපකෘත පාසල් ඇත්තේ ඉතා ස්වල්පයකි. මේවායින් වැඩි ප්‍රමාණයක් පෞද්ගලික සංවිධාන මගින් පවත්වාගන යනු ලබයි. සමහර පාසල් පෞද්ගලික ආධාරවලින් නඩත්තු වන අතර අනෙක්වා රජයෙන් සීමා සහිත ආධාර ලබයි. ඒ අනුව, එම පාසල් උපකෘත පාසල් වර්ගයට අදාළ වේ.

2. මෙම උපකෘත පාසල්වල ගුරුවරුන්ව එම අදාළ පාසලෙන්ම ඔවුන්ගේ අවශ්‍යතා අනුව බඳවා ගනු ලබයි. එම උපකෘත පාසලේ කළමනාකාරවරයාගේ නිර්දේශය මත එම ගුරුවරුන් ශ්‍රී ලංකා උපකෘත පාසල් ගුරු සේවයට ඇතුළත් කර ගැනීමක් කරන අතර ඒ සඳහා පාසලේ ගුරුවරුන්ගේ අනුමත නිලධාරීන්ගේ පුරප්පාඩු අනුව අදාළ ගුරුවරුන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. එසේ නොමැත්නම්, ඔවුන් ශ්‍රී ලංකා උපකෘත පාසල් ගුරු සේවයට බඳවා ගනු නොලබයි.

3. අදාළ පාසල් මගින් බඳවා ගැනීම හේතුවෙන් මෙම පාසල්වල ගුරුවරුන්ට ඒවායින් පිට ස්ථාන මාරුවීම් සඳහා අවකාශ නොමැත. ඔවුන් මේ පිළිබඳව බඳවා ගැනීම සිදුකරන අවස්ථාවේ සිටම දැනුවත්ව සිට ඇත. ශාඛා ජාලයක් නොමැති වෙනත් යම් පෞද්ගලික පාසලක හෝ පෞද්ගලික ආයතනයක තත්ත්වයට වඩා මෙය වෙනස් නොවේ. ඔවුන් විසින් අදාළ පත්වීම භාරගත් පසු එම පාසල්වල තමන් අස්වන තුරු, සේවය අත්හිටුවන තුරු හෝ විශ්‍රාම යන තුරු එහිම සේවය කිරීමට කැමති විය යුතුය.

4. කෙසේවෙතත්, විවිධාකාර හේතු සාධක හේතුවෙන් සිදුවන වෙනස්වීම් තත්ත්ව වලදී මෙය පැහැදිළිවම ඔවුන් බොහෝ දෙනෙකුට කලකිරවනු ඇත. එසේවුවද, මෙය ස්ථාන මාරු වීම් රහිත රැකියාවල නියුතුවන්නන්ගේ තත්ත්වයට වඩා වෙනස් නොවේ.

5. දැනට මෙවැනි පාසල්වලට ලැබෙන ආධාර ප්‍රමාණවත්දැයි නිශ්චිතව දැන ගැනීමට නොහැකිවී ඇත්තේ, පාසලට සහභාගී වන අය ඔවුන්ගේ පාසලට සෘණ රූපයක් දීමට කැමැත්තක් නොමැති නිසාවෙනි. කෙසේවෙතත්, පොදු තොරතුරු විමසීමේදී ඔවුන් විසින් නිර්මාණය කරන ලද සමස්ථ කාවැද්දීම වූයේ එම පාසල් අනිවාර්යයෙන්ම වැඩිදුර ආධාරවලින් ප්‍රතිලාභ ලබන බවයි.

6. මෙම පාසල්වල පරිපාලනයේ දූෂණ තිබේද යන්න නිශ්චිතව දැන ගැනගත නොහැක. සහභාගිවූවන්ගෙන් මේ පිළිබඳව සෘජුවම ප්‍රශ්න කළ විට ඔවුන් එය ප්‍රතික්ෂේප කරන ලදී. තවදුරටත්, ලිපියේ දෝෂාරෝපණය කළ කිසිදු තැනැත්තෙකු පොදු තොරතුරු විමසීම සඳහා සහභාගී වූයේ නැත.

7. මෙම ළමුන්ගේ අවශ්‍යතා අනුව භාවිත නොකරනු ලබන පාසල් නැවත භාවිතයට ගැනීම හෝ වෙනස් කිරීම හෝ නිර්දේශ කාරීමට හැකියාවක් නොමැත. කෙසේවෙතත්, මෙම උපකෘත පාසල් සඳහා සහභාගී වන ළමුන් සාමාන්‍ය පාසල් වෙත යොමු කිරීම පිළිබඳව පොදු තොරතුරු විමසීම සඳහා සහභාගී වූවන් නැඹුරු නොවුනද විකල්පයක් ලෙස කළ හැකිය. තවදුරටත්, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සම්බන්ධයෙන් සුදුසකම්ලත් තැනැත්තකු විසින් මේ සම්බන්ධයෙන් තීරණ ගත යුතු බවට අනු-කමිටුවේ විශ්වාසයයි. සාමාන්‍ය පෞද්ගලික පාසල් කිහිපයක්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ එම අවශ්‍යතා සපුරාලීම සාර්ථකව කරගෙන යනු ලබයි.

5. නිර්දේශ:

1. උපකෘත පාසල්වල විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන් ඉතා සුවිශේෂී සහ අත්‍යාවශ්‍ය සේවාවක් ලබා දෙනු ලබයි. එවැනි ළමුන් සමග කටයුතු කිරීමට හා ඔවුන්ට ඉගැන්වීමට මෙම ගුරුවරුන් සතු හැකියාව අවුරුදු ගණනාවක් පුරාවට ඔවුන් ලබන ප්‍රායෝගික පළපුරුද්ද මගින් සුදුසු පරිදි වැඩිදියුණු කරගනිමින් ඉදිරියට යාමට හැකියාව ලබාදෙයි. එමනිසා, මෙවැනි පළපුරුදු ගුරුවරුන්ගේ සේවය හැකිතාක් කාලයක් පවත්වාගෙන යෑම එවැනි පාසල්වලට අනිවාර්යෙන්ම වාසිදායක වන අතර එම පාසල්වල සිසු දරුවන්ටත් ප්‍රබලවම සමාජයටත් වාසිදායක වේ.

   මෙම ගුරුවරුන් හට ඉහත දැක්වූ ආකාරයට ස්ථාන මාරු සම්බන්ධයෙන් නෛතික හා ප්‍රායෝගික අභියෝග පවතින නිසාවෙන් මෙවැනි උපකෘත පාසල් අතර ගුරු සුහද මාරු ලබාදීමේ ක්‍රමවේදයක හැකියාවක් පවතීද යන්න සොයාබැලීම වඩාත් උචිත වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ අංශය මගින් පාසල් අධීක්ෂණය කිරීමෙන් මෙවැනි ස්ථාන මාරු අපේක්ෂා කන අයවලුන්ගේ නම් ලයිස්තුවක් පවත්වාගේන යා හැකිය. ගැලපෙන ඉල්ලීම් ඇතිවිට එම ගුරුවරුන් හා එම පාසල් අතර සුහද මාරුවක් ලෙස ස්වේච්ඡාවෙන්ම ස්ථාන මාරුව ක්‍රියාත්මක කළ හැකිය. මෙවැනි ක්‍රමවේදයක් මගින් පළපුරුදු කාර්ය මණ්ඩලයක් මෙම ක්ෂේත්‍රයේ තබා ගැනීමට හැකියාව ලබාදෙන අතරම තම ජීවිත තෝරා ගැනීම් අවස්ථා සඳහාද ගුරුවරුන්ට ඉඩ ප්‍රස්ථා ලබා දෙයි.

2. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සංඛ්‍යාන තොරතුරු මත, අනාගතයේදී මෙවැනි පාසල් වර්ධනය කිරීම හෝ අලුතෙන් ඇතිකිරීමේ අවශ්‍යතා ඇති විය හැකිය. මෙලෙස එම පාසල් වර්ධනය කිරීමේ ප්‍රායෝගික කරුණ සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යනයක් කළ යුතු වේ.

3. වාර්තාවූ ළමුන් සංඛ්‍යාවේ අඩුවීම, එම ළමුන්ට අවශ්‍ය කරන අධ්‍යාපනය නොලැබීම පිළිඹිබු කරන අතර එය තැති ගැන්මක් ඇති කරවයි. මෙතරම් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සංඛ්‍යාවක් අර්ථවත් අධ්‍යාපනයක් නොලැබීමට හේතූන් අවධානයෙන් යුතුව අධ්‍යනය කර මෙම තත්ත්වයට සුදුසු ක්‍රියාමාර්ග මගින් විසඳුම් ලබා දිය යුතු වේ.

4. ඉහත කාර්යයන් සිදුකිරීම සඳහා විශාල නීති ප්‍රතිසංස්කරණ අවශ්‍ය නොවේ. එමනිසා, පවතින ව්‍යවස්ථාවට කිසිදු සංශෝධනයක් අනු-කමිටුව විසින් නිර්දේශ කරනු නොලැබේ.

3. ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සංශෝධනය

නිර්දේශිතය	ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සංශෝධනය
පසුබිම	අධිකරණ අමාත්‍යාංශය විසින් MOS/L4/556/2023 දරන 2023.05.22 දිනැති ලිපියෙන් නීති කොමිෂන් සභාව වෙත උක්ත නීති සංශෝධනය පිළිබඳ සලකා බලන ලෙස ඉල්ලීමක් කරන ලදී.
වර්තමාන තත්ත්වය	නීති කොමිෂන් සභාව විසින් ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්තේ මහතාගේ ප්‍රධානත්වයෙන් උක්ත නීති ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අනුකමිටුවක් පත් කරණ ලදී. ප්‍රාථමික අධිකරණ නඩු විධාන සංග්‍රහය පිළිබඳ පනතෙහි හත්වන කොටස (Vii) සංශෝධනය සඳහා අවධානය යොමු විය. ප්‍රාථමික අධිකරණ කාර්යපටිපාටිය පිළිබඳ පනත වගන්ති 66 සිට 76 දක්වා පමණක් (Vii කොටස) සීමා වී ඇති බව නිරීක්ෂනය කරණ ලදී. 66 වගන්තිය යටතේ ප්‍රාථමික අධිකරණයට ලැබී ඇති අධිකරණ බලය විශේෂ අධිකරණ බලයකි. එය අර්ධ වශයෙන් අපරාධමය අධිකරණ බලයක් ද වේ. මෙම අධිකරණ බලයේ මූලික අරමුණ වන්නේ ඉඩමක් සම්බන්ධයෙනක් ඇති වන ආරවුලකින් සිදු විය හැකි සාමය කඩවීමක් වලක්වා ගැනීමයි. අධිකරණ මෙම අධිකරණමය බලය යොදා ගැනීමේදී භුක්තිය සඳහා අයිතිය සෙවීම සඳහා යොදා නොගත යුතු අතර එය සිවිල් අධිකරණය සතු කර්තව්‍යයකි. ප්‍රාථමික අධිකරණය විසින් සිදු කළ යුත්තේ සිවිල් අධිකරණයක් විසින් අයිතිය තිරණය කරන තෙක් සාමය කඩ වීම වැලැක්වීම සඳහා පමණක් එම අධිකරණ බලය යොදා ගැනීම බව අනුකමිටු වාර්තාවෙන් යෝජනා විය. **යාවත්කාලීන ප්‍රගතිය :** අනුකමිටුව විසින් යෝජිත වාර්තාව නීති කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට සාකච්ජා කරන ලදී. අදාල වාර්තාව අවසානාත්මක ලෙස අනුමත කිරීම සඳහා 2024.01.18 දින නීති කොමිෂන් සභා රැස්වීම වෙත ඉදිරිපත් කිරීමට නීති කොමිෂන් සභාව තීරණය කරන ලදි.
	නීති කොමිෂන් සභා රැස්වීම් 08

VII වන කොටස සඳහා විශේෂ අවධානය සහිතව ප්‍රතිසංස්කරණයට යොමු කරන ලද ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත සම්බන්ධ වාර්තාව.

පවතින අධිකරණ බලය.

අධිකරණ සංවිධාන පනතේ 32 හා 33 වගන්ති යටතේ ප්‍රාථමික අධිකරණවල අධිකරණ බලය දක්වා ඇත. ප්‍රාථමික අධිකරණයක අධිකරණ බලයෙන් විශේෂයෙන්ම ඉවත් කර ඇති නඩු ප්‍රවර්ග 36ක් 4 වන උපලේඛනයේ වෙන් කර දක්වා මුදල් සීමාව රුපියල් 1500 ට ස්ථිර කිරීම හේතුවන් පවරා ඇති සිවිල් අධිකරණ බලය ඇත්තවශයෙන්ම අතිරික්තයකි.

අනෙක් අතට, අපරාධ අධිකරණ බලය අමාත්‍යවරයාගේ අභිමතය පරිදි භාවිත කළ හැකිය. ඒ, අපරාධ අධිකරණ බලය සම්බන්ධ අධිකරණ සංවිධාන පනතේ 33 වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් ගැසට් කරන ලද නියෝග මත බලාත්මක කළ හැකි නිසාවෙනි.

කෙසේවතත්, ඇතැම්විට දැනට අපරාධ අධිකරණ බලය ඵලදායීව භාවිත නොවීමට හේතුව වන්නේ, අමාත්‍යවරයා විසින් සමහර වරදවල් සමග සීමා කිරීම් නියම කිරීම් සහ එම වරදවල් සම්බන්ධයෙන් වන වෙනත් නියෝග දක්වමින් ගැසට් නිකුත් කිරීමේ අවශ්‍යතාව විය හැකිය.

එමෙන්ම, ප්‍රාථමික අධිකරණ නඩු විධානයේ එකම ප්‍රායෝගික භාවිතය එකී පනතේ VII වන කොටස යටතේ දක්වා ඇති ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 සිට 76 වගන්තිවල සඳහන් කරුණු මගින් 66 වගන්තියෙන් ඉල්ලීම යනුවෙන් සාමාන්‍යයන් හඳුන්වනු ලබන්නට සීමා වී ඇති බව පෙනේ.

VII වන කොටස යටතේ වන කරුණු සම්බන්ධ අධිකරණ බලය, සිවිල් හෝ අපරාධ අධිකරණ බලය යටතේ වර්ගීකරණය නොකර අර්ධ අපරාධී *(Quasi criminal)* ලෙස හැඟවීමට අධිකරණය අර්ථ නිරූපනය කර ඇත.

ප්‍රාථමික අධිකරණයක 66 වගන්තිය යටතේ සාකච්ඡා කළ අධිකරණ බලය විශේෂ අධිකරණ බලයකි. එය අර්ධ අපරාධී *(Quasi criminal)* අධිකරණ බලයකි. සාකච්ඡා කරන ලද අධිකරණ බලයේ මූලික පරමාර්ථය වනුයේ, ඉඩමකට බලපානු ලබන ආරවුලක් සම්බන්ධයන් පැනනගින සාමය කඩකිරීමක් වැලැක්වීම වේ.

මෙම අධිකරණ බලය භාවිත කිරීමේදී, එම අධිකරණය විසින් සිවිල් අධිකරණයක කාර්යය වන්නාවූ හිමිකම හෝ සන්තකයේ තබා ගැනීමට ඇති අයිතිය සම්බන්ධ විමර්ශනයකට සහභාගී නොවේ. සිවිල් අධිකරණයකදී, අවසන් විනිශ්චයට භාවනව පවතින්නාවූ අයිතිවාසිකම් වැළැක්වීම හා යාවකාලීන ස්වභාවය පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගත යුතුය. කනගසබේ එරෙහිව මයිල්වාගනම් 78 නව නීති වාර්තා 280 සහ පුංචිනෝනා එරෙහිව පදුමසේන [1994] 2 ශ්‍රී ලංකා නීති වාර්තා 117 බලන්න.

66 වගන්තියෙන් ඉල්ලීම මගින් අධිකරණ බලය ආයාචනා කිරීම සිදු කළ හැකි වන්නේ;

1. ඒ ආරවුල පිළිබඳව පරීක්ෂණයක් පවත්වන පොලිස් නිලධාරියා විසින් (66 (1) (අ) වගන්තිය) නැතිනම් ;
2. ඒ ආරවුලට සම්බන්ධ යම් පාර්ශ්වකරුවකු විසින් (පෞද්ගලික පැමිණිල්ලක් මගින් - දිවුරුම් පත්‍රයක් මගින්) (66 (1) (ආ) වගන්තිය) වේ.

කෙසේවෙතත්, පොලීසිය විසින් වාර්තාවක් ගොණු නොකර පාර්ෂ්වකරුවකු විසින් ඉල්ලීමක් සිදු කරන ලද අවස්ථාවකදී, ‘‘සාමය කඩකිරීමේ ඉඩකඩක්’’ අනාවරණය වූවාද නැද්ද යන වග තීරණය කිරීම අධිකරණයේ අභිමතය පරිදි සිදු වේ.

ආරවුල් සහ ආඥා වර්ග.

ආරවුල යම් ඉඩමක සන්තකයේ හෝ ඉඩම සන්තකය හැරුණුකොට යම් ඉඩමක සන්තකයට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන්ද යන්න මත, සාමය කඩවීමක් වැළැක්වීමේ අරමුණින් 68 වගන්තිය හෝ 69 වගන්තිය යටතේ වෙන වෙනම පිළිවෙලින් ආඥාවක් කළ හැකිය.

පනතෙන් අපේක්ෂා කරන පරිදි, යම් ඉඩමක සන්තකයට ඇති හිමිකම සම්බන්ධයෙන් 68 වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබයි.
සන්තකය සම්බන්ධයෙන් වූවක් වන අවස්ථාවක, පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබූ දිනයේදී සන්තකය දැරුවේ කවරකුද යන්න තීරණය කිරීමත්, හිමිකම සලකා බැලීමක් නොකර සන්තකයට හිමිකම ලැබිය යුත්තේ කවරකුද යන්න පිළිබඳව ආඥාවක් කිරීමත් , මහේස්ත්‍රාත්වරයාගේ කාර්යය වේ - 68 (1) වගන්තිය බලන්න.
ඉඩමේ සන්තකයේ අයිතිවාසිකම ලබාදීම සම්බන්ධයෙන්, ඒ ඉඩමේ හෝ ඒ ඉඩම් කොටසෙහි සන්තකය දැරූ යම් තැනැත්තකුගේ එම සන්තකය පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබූ දිනයට පූර්වයෙන් වූ මාස දෙකක කාලය තුළදී බලහත්කාරයෙන් ඔහුට අහිමි කර ඇති බවට මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම් ද 68 වගන්තිය යටතේ ආඥාවක් කළ හැකිය - 68 (3) වගන්තිය බලන්න.
ඒ ආරවුල යම් ඉඩමක හෝ ඉඩමක යම් කොටසක හෝ සන්තකයට ඇති අයිතිවාසිකම සම්බන්ධයෙන් වූවක් නොව, ඒ ඉඩමේ හෝ එහි කොටසක හෝ වෙනයම් අයිතිවාසිකමකට සම්බන්ධ වූවක් වන අවස්ථාවකදී, උදාහරණ ලෙස පරවශතා අයිතිය ආදිය, 69 වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබයි.
68 වගන්තිය යටතේ ආඥාවක් මත පදනම්ව සන්තකය දරන තැනැත්තකුට හෝ 69 වගන්තිය යටතේ ආඥාවක් මත පදනම්ව අයිතිවාසිකම භාවිත කරන තැනැත්තකුට නිසි බලය ඇති අධිකරණයක් මගින් කරන ලද ආඥාවකින් හෝ තීන්දු ප්‍රකාශයක් මගින් එකී ආඥාව ඉවතලන තෙක් එසේ අයිතිවාසිකම භාවිත කිරීම කළ හැකිය.
68 වගන්තිය හෝ 69 වගන්තිය යටතේ ආඥාවක් කළ පසු, පනතේ 76 වගන්තියෙන් අවශ්‍ය වූ විට රිට් ආඥා පත්‍රයක් ක්‍රියාත්මක කිරීම බලදායී කරනු ලැබේ.

<u>බාධක සහ සිදුකළ හැකි ප්‍රතිසංස්කරණ.</u>

1. **ඉතා දීර්ඝ කාලයක සිටම ආඥා ඵලදායී වීම -** ප්‍රාථමික අධිකරණයක් මගින් කරනු ලබන ආඥාවල ස්වභාවය මෙම කාර්යපටිපාටියේ ප්‍රබලම බාධකය සඳහා සෘජු සම්බන්ධයක් නොමැත. ඊට හේතු වන්නේ, අභියාචනා දෙකකින් සමන්විත දිස්ත්‍රික් අධිකරණ නඩුවක අයිතිය තීරණය කිරීමේදී සිදුවන නොවැළැක්විය හැකි ප්‍රමාදයන් වේ.

   දිස්ත්‍රික් අධිකරණයක් මගින් අවසාන තීරණය කරන තෙක් ප්‍රාථමික අධිකරණ ආඥාවක් පවතියි - කනගසබේ එරෙහිව මයිල්වාගනම් (78 න.නී.වා. 280) තීන්දුව. ප්‍රාථමික අධිකරණයක් මගින් කරනු ලබන මෙම ආඥා තාවකාලික ස්වරූපයක් දරන අතර වසර කීපයක් යනතෙක්ම ඵලදායී වන අතර එය (සමහරවිට අභියාචනා විසඳෙනතුරු) අනවසරයෙන් ඇතුළුවූවන්ට හෝ රස්තයාදුකාරයන්ට අසමාන කාලයකට සන්තකයේ තබාගෙන සිටීම බලදායී කරයි.

   ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ VII වන කොටස යටතේදී සාමය කඩවීමේ තර්ජනයක් ඇත්තාවූ හෝ සාමය කඩවීමට ඉඩකඩ ඇත්තාවූ යම් ඉඩමක සන්තකය සම්බන්ධයෙන් වන්නාවූ ආරවුල පිළිබඳ විභාගයකදී තීන්දුව සඳහා මූලික කරුණ වන්නේ, 66 වගන්තිය යටතේ තොරතුරු ගොණු කරනු ලබන දිනට විද්‍යාමාන වන සන්තකයයි. නමුත්, එකී තොරතුරු ගොණු කරනු ලැබූ දිනයට පූර්වයෙන් වූ මාස දෙකක කාලය තුළදී බලහත්කාරයෙන් අහිමි කිරීමකදී මූලික කරුණ වන්නේ, අහිමි කිරීම සම්බන්ධයෙන් චෝදනා කරන දිනයට පෙරාතුවදී විද්‍යාමානවූ සන්තකයයි. 66 වගන්තිය යටතේ තොරතුරු ගොණු කරනු ලැබූ දිනයේදී ඉඩමේ හෝ කොටසේ සන්තකය දැරුවේ කවරකුද යන්න තීරණය කිරීම පමණක් 68 වගන්තියෙන් සලකනු ලබයි. එය, එවැනි සන්තකයක් තිබූ තැනැත්තාට එම ඉඩමට හෝ කොටසට හිමිකම් ඇති බව ප්‍රකාශ කිරීමට විනිශ්චයකාරවරයා යොමු කරනු ලබයි. 68 (3) වගන්තිය අදාළ වන්නේ, 66 වගන්තිය යටතේ තොරතුරු ගොණු කරනු ලැබූ දිනයට පූර්වයෙන් වූ මාස දෙකක කාලය තුළදී බලහත්කාරයෙන් යම් පාර්ශ්වයකගේ සන්තකය අහිමි කර ඇති බවට විනිශ්චයකාරවරයා තීරණය කළහොත් පමණි. මෙම උපවගන්තිය මගින්, තොරතුරු ගොණු කරනු ලැබූ දිනයට පෙරදිම ඇත්තෙන්ම

සන්තකය අහිමිවී තිබියදී වුවත්, එවැන්නක් සිදුවූයේ තොරතුරු ගොණු කරන ලද දිනට ඉක්බිතිවම එළඹෙන්නාවූද අධිකරණය ඊළඟට රැස්වන්නාවූ දිනයට මාස දෙකක කාලයක් ඇතුළත බව යම් පාර්ශ්වයක් ඔප්පු කළහොත්, ඔහුට තොරතුරු ගොණු කරන ලද දිනයේ සන්තකය දරා සිටීමට හැකියාව ලබා දෙයි. ඇත්තෙන්ම සන්තකය දරන යම් තැනැත්තෙකු තොරතුරු ගොණු කරන ලද දිනට සන්තකය දැරීමක් නොකළ බව කිව හැක්කේ එම පාර්ශ්වය එම තොරතුරු ගොණු කරන දිනට ගිවිසුමකට ඇතුළත්වී නම් හෝ සන්තකය දරන බවට සැලකේ නම් පමණකි. එමනිසා, 68 වගන්තිය යටතේ නඩු කටයුතු සිදුකරන විනිශ්චයකාරවරයාගේ කාර්යය වන්නේ, අදාළ දිනයේදී, එනම්, 66 වගන්තිය යටතේ තොරතුරු ගොණු කරන දිනට සන්තකය දැරුවේයැයි සැලකෙන හෝ දැරූ බවට ඔප්පු වූ පාර්ශ්වය නිර්ණය කිරීම වේ. 68 වගන්තිය යටතේ, නියම අයිතිකරුගේ අතුරු බාධනයට විරුද්ධව කරන ලද අනවසර ඇතුල්වීමකදී වුවත් යම් තැනැත්තකුගේ සන්තකය පවත්වාගෙන යාමට විනිශ්චයකාරවරයා බැඳී සිටියි. මෙම වගන්තියෙන් රස්තයාදුකරුවකු පවා, තොරතුරු ගොණු කර මාස දෙකක් ඇතුළතදී ඔහුගේ සන්තකය අත්පත් කර නොගතහොත්, නීතියේ ආරක්ෂාවට යටත් කරනු ලැබේ.

නියමිත නීති කාර්යයෙන් පහ කරන තුරුම එම තැනැත්තා සන්තකයට හිමිකම දරනු ලබයි. එමනිසා, විනිශ්චයකාරවරයකු විසින් ඉඩමට සන්තකය දැරූ තැනැත්තාට තොරතුරු ලබා දුන් දිනට පෙර මාස දෙකක කාලයක් ඇතුළතදී බලහත්කාරයෙන් එය අහිමි කළ අවස්ථාවලදී හැර, ඉහතකී පනතේ VII වන කොටස යටතේ විභාගයක් පවත්වා තොරතුරු ගොණු කළ දිනයේ සත්‍ය සන්තකය පිළිබඳ ගැටළුවට තමාව සීමා කරගත යුතුය. රාමලිංගම් එරෙහිව තංගරාජා [1982] 2 ශ්‍රී ලංකා නී.වා.693 බලන්න.

ඊට අමතරව, VII වන කොටස යටතේ කරන ලද ආඥාවකට එරෙහිව අභියාචන කිරීම හෝ ප්‍රතිශෝධන ඉල්ලීමක් කිරීම සිදුකළ නොහැකි බව 74(2) වගන්තියෙන් දක්වයි. ප්‍රතිශෝධන ඉල්ලීමක් කළ හැකි වුවත් පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සඳහා දිස්ත්‍රික් අධිකරණයක් වෙත යා යුතු බැවින් එය ඵලදායී විසඳුමක් නොවේ.

ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ VII වන කොටස යටතේ ප්‍රාථමික අධිකරණයක් මගින් කරන ලද ආඥාවක් පාර්ශ්වකරුවන්ගේ අයිතීන් මත පදනම්වූ අතුරු ආඥාවක් මගින් වෙනස් කිරීමට හෝ ඉවතලීමට හිමිකමක් දිස්ත්‍රික් අධිකරණයට ලබාදීමට නියමිත විධිවිධාන සලසා දුනහොත් මෙම විෂමතාවට විසඳුම් ලබාදිය හැකියි.

2. අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීම සඳහා අභිමත - වග. 66 (1) මත පදනම්ව යම් ආරවුලක්, පොලිසිය මගින් හෝ පෞද්ගලික පැමැණිල්ලක් (දිවුරුම් පත්‍ර) මගින් අධිකරණය වෙත යොමු කළ හැකිය.

ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 (1) (අ) වගන්තිය යටතේ සාමය කඩවීමේ තර්ජනයක් ඇත්ද නැතහොත් සාමය කඩවීමට ඉඩකඩ ඇත්ද යන්න තීරණය කර මතයක් ගොඩනැගීම ආරවුල සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන පොලිස් නිලධාරියා සතු වේ. ඉඩමට බලපානු ලබන ආරවුලක් ඇත්නම් සහ සාමය කඩවීමේ තර්ජනයක් හෝ සාමය කඩවීමට ඉඩකඩක්

තිබේනම් තොරතුරු ගොණු කිරීමට පොලිස් නිලධාරියාට බලය පවරා ඇත. සාමය කඩවීමේ තර්ජනයක් හෝ සාමය කඩවීමට ඉඩකඩක් තිබේද කියා පරීක්ෂණය කිරීමට මහේස්ත්‍රාත්වරයා සම්බන්ධ නොවේ. 66 (2) වගන්තිය ප්‍රකාරව 66 (1) (අ) හෝ 66 (1) (ආ) යටතේ ගොණු කළ තොරතුරුවලට අදාළව ආරවුල සම්බන්ධයෙන් විභාග කොට තීරණයක් දීමට අධිකරණයට අධිකරණ බලය සතු කර ඇත. කෙසේවෙතත්, 66 (1) (ආ) වගන්තිය යටතේ තොරතුරක් ගොණු කළ අවස්ථාවකදී මහේස්ත්‍රාත්වරයාට තමා ඉදිරියේ ඇති එකම කරුණ පක්ෂග්‍රාහී තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් පත්‍ර තොරතුරු වන අතර එවැනි අවස්ථාවකදී පොලිස් වාර්තාවකින් වැඩිදුර උපකාර ලබා නොගෙන, මහේස්ත්‍රාත්වරයා විසින් සුපරීක්ෂාකාරීව ඉදිරි කටයුතු කරගෙන ගොස් ඉඩමක් සම්බන්ධ ආරවුලක් පවතීද යන්න සහ සාමය කඩවීමේ තර්ජනයක් හෝ සාමය කඩවීමට ඉඩකඩක් තිබේද යනාදිය පිළබඳ පෞද්ගලික අවබෝධයක් ලබා ගත යුතුය. වේලුපිල්ලෙයි සහ වෙනත් අය එරෙහිව සිවනාදන් [1993] 1 ශ්‍රී ලංකා නී.වා. 123 බලන්න.

66 (1) (ආ) වගන්තිය යටතේ පෞද්ගලික පාර්ෂ්වයක් මගින් කරන ලද තොරතුරු ලබාදීමකදී, එම තොරතුරෙන් සාමය කඩවීමේ තර්ජනයක් හෝ සාමය කඩවීමට ඉඩකඩක් තිබේද කියා ප්‍රථමයෙන් තමන්ට දැනගැනීම සඳහාත් එම තත්ත්වයන් යටතේ මෙවැනි විශේෂ අධිකරණ බලයක් උපකල්පනය කිරීම තමන් සාධාරණව සිදුකළාද යන්න දැනගැනීම සඳහාත් ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකුට පැවරූ වගකීමක් සේ වන අතර එසේ කළ නොහැකි වීම විනිශ්චයකාරවරයාගේ අධිකණ බලය අහිමි කරයි. පුංචි නෝනා එරෙහිව පදුමසේන [1994] 2 ශ්‍රී ලංකා නී.වා. 117 බලන්න.

පොලිසිය විසින් පැමිණිල්ල ඉදිරිපත්තළ විටදී, සත්‍යවශයෙන්ම සාමය කඩවීමේ තර්ජනයක් තිබේද යන්න තීරණය කිරීමට හෝ පරීක්ෂණයක් කළ යුතුද යන්න තීරණය කිරීමට අභිමතය ඔවුන් සතු වේ. එමනිසා, ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වගන්තිය යටතේ වාර්තාවක් ඉදිරිපත් කරනවාද නැද්ද යන්න තීරණය කිරීමට පොලීසිය සතුව සම්පූර්ණ බලය ඇත. වලංගු නඩුවක් තිබියදීත් පොලීසිය විසින් පැමිණිල්ලකට ක්‍රියා නොකිරීම ඉහත බලය අවභාවිත විය හැකි සමහර අවස්ථාවකි. එමෙන්ම සාමය කඩවීමක් නොමැතිවද පැමිණිල්ල ඉදිරිපත් කරන පුද්ගලයාට සහය දැක්වීම පිණිස වාර්තාවක් ගොණු කිරීමට පොලීසියට කටයුතු කළ හැක.

තවද, මීට අමතරව, පොලීසිය විසින් පැමිණිල්ලකට ක්‍රියාත්මක නොවුනහොත්, සාමය කඩවීමේ ඉඩකඩක් ඇති බවට අධිකරණය සෑහීමකට පත්වේ නම් හැර තනි පුද්ගලයකුට තමන් විසින් ඉල්ලීමක් කිරීමට හැකියාවක් නොමැත. සාමය කඩවීමේ ඉඩකඩක් පැවතීම පිළිබඳ සෑහීමකට පත්වීම මූලික කරුණක් වන නිසා විනිශ්චයකාරවරුන් විසින් ද අභිමත භාවිත කරමින් මෙම අධිකරණ බලය අයැදීම අධෛර්යමත් කරනු ලැබිය හැකිය.

ඉතා පැහැදිලි ස්වභාවයකින් අධිකරණ බලය පැවරීම මගින් සහ අධිකරණ බලය සම්බන්ධයෙන් වන අභිමත මූලාංග ඉවත් කිරීම මගින් මෙම විෂමතාව නිවැරදි කරගත හැකිය. මේ කාර්යය සඳහා (ජනාධිපති නීතීඥ පාලිත කුමාරසිංහ මයා විසින් ඉදිරිපත් කරන ලද) පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ යෝජිත පනතේ විධිවිධානවලට සුදුසු වෙනස්කම් සහිතව යොදාගනිමින් භාවිත කළ හැකිය.

ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ VII වන කොටස යටතට මෙම විධිවිධාන අන්තර්ගත කිරීම මගින් ඉඩමේ සන්තකය හෝ ඉඩමේ සන්තකයට අයිතිය සම්බන්ධයෙන් වන විටදී අධිකරණ බලයේ ප්‍රධාන නිර්ණායකය සෑදීම සඳහා සලකා බැලිය හැකි පැමිණිලි කළ පනත්වල විෂය පථය විග්‍රහ කිරීමේ කාර්යය සඳහා යොදා ගත හැකි වේ.

අධිකරණ බලය සම්බන්ධයෙන් වන විටදී, (වග. 69 යටතේ ආඥා කරනු ලබන වහල් භාවය වැනි) සන්තකයට ඇති හිමිකම හැරුණුකොට යම් ඉඩමක අයිතිය පිළිබඳ ආරවුල් සලකා බලා මෙවැනි යම් ආරවුලක් ඕනෑම තැනැත්තකුට ප්‍රාථමික අධිකරණයකින් දිස්ත්‍රික් අධිකරණයක් වෙත ඉදිරිපත් කිරීම කළ හැකි වන්නාවූ යම් නිශ්චිත කාලයකට බලපානු ලබන ආඥාවක් ලබා ගැනීමට ඉදිරිපත් කිරීමේ හිමිකම ඇති බව දක්වා ඇත.

3. කියාත්මක කිරීම සඳහා ලබාදී ඇති සීමාරහිත කාලය - ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන අනෙක් ක්ෂේත්‍රය නම්, දිස්ත්‍රික් අධිකරණයකදී නම් අවුරුදු 10ක කාලයකට තහනමකට ලක්වන රිට් ආඥාවක් වෙනුවට ඕනෑම අවස්ථාවකදී රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලබාදීමයි. ආඥාව කිරීමෙන් වසර ගනණාවකට පසු රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීම මගින් (ඉහළ අධිකරණයකින් ආඥාවක් වෙනස් කරන අවස්ථාවකදී) නඩුවට සම්බන්ධ නැති තැනැත්තන් සන්තකය දරනු ලබන සමහර අවස්ථාවලදී බරපතල අසාධාරණයක් සිදු විය හැකි වේ. රිට් ආඥාවක් ක්‍රියාත්මක කළ හැකි නිශ්චිත ආකාරයක් නියම කිරීමෙන් සහ ඊට කාල රාමුවක් නියම කිරීමෙන් මෙම අංශය ද ප්‍රතිසංස්කරණය කළ හැකිය. ජයන්ත ගුණසේකර එරෙහිව ජයතිස්ස ගුණසේකර සහ වෙනත් අය[2011] 1 ශ්‍රී ලංකා නී.වා. 284 හි සාකච්ඡා කරන ලද ලෙස අත්හැරුණු කරුණු අන්තර් වාක්යය (Casus Omissus Clause) පරිදි එකිනෙක සටියනය වන අධිකරණ තීරණ (වග. 78) අතිරික්තව යෙදීම නිසා මෙම විෂමතාව ඇතිවී ඇත.

<u>**යෝජනාවල සාරාංශය.**</u>

ඒ අනුව, යෝජිත ප්‍රතිසංස්කරණ පහත පරිදි වේ.

1. අතුරු ආඥාවක් මගින් ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ VII වන කොටස යටතේ හා ඊට අදාළව ප්‍රාථමික අධිකරණයක් විසින් කරන ලද ආඥාවක් වෙනස් කිරීමට හෝ ඉවතලීමට දිස්ත්‍රික් අධිකරණයට අයිතිය පිරිනැමීම.

2. ප්‍රාථමික අධිකරණයක විනිශ්චයට භාජනව පවතින ඉඩමේ සන්තකයේ අයිතිය හැරුණුකොට ඉඩමකට බලපාන ඕනෑම ආරවුලක් ඕනෑම තැනැත්තෙකුට එම ආරවුල (නිර්දිශ්ට කාලයක් ඇතුළතදී) දිස්ත්‍රික් අධිකරණය වෙත ගෙන ඒම බලදායී කිරීම.

3. (ජනාධිපති නීතීඥ පාලිත කුමාරසිංහ මයා විසින් ඉදිරිපත් කරන ලද) පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ යෝජිත පනතේ විධිවිධාන නීතිගත කිරීම මගින්, නිශ්චල දේපළ සන්තකය සම්බන්ධ කරුණුවලට අදාළව සමහර සීමාවලට යටත්ව පාර්ශ්වකරුවන්ට අධිකරණ බලය අයැද සිටීමේ අයිතියට අවසර ලබා දීම.

4. රිට් ආඥාව ක්‍රියාත්මක කිරීමට කාල රාමුවක් සැකසීම.


මෙම ප්‍රතිසංස්කරණ වලට / වෙනස් කිරීම් (සංශෝධන) වලට යටත්ව VII වන කොටසේ විධිවිධාන එලෙසම තබාගෙන යෝග්‍ය ලෙස ප්‍රාථමික අධිකරණ නඩු විධානයේ අතිරික්ත කොටස් ඉවත් කරන ලෙසට නිර්දේශ කරනු ලබමි.
නීති කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ මග පෙන්වීම මත මෙම වාර්තාව සකසන ලදී.

සමන්ත රත්වත්තේ.

ආශ්‍රිත ග්‍රන්ථ:

1. අධිකරණ සංවිධාන පනත, 32 හා 33 වගන්ති.
2. ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත, විශේෂයෙන්ම 66,68,69 සහ 76 යන වගන්ති.
3. කනගසබේ එරෙහිව මයිල්වාගනම් 78 න.නී.වා. 280.
4. පුංචි නෝනා එරෙහිව පදුමසේන [1994] 2 ශ්‍රී ලංකා නී.වා. 117.
5. රාමලිංගම් එරෙහිව තංගරාජා [1982] 2 ශ්‍රී ලංකා නී.වා.693.
6. වේලුපිල්ලෙයි සහ වෙනත් අය එරෙහිව සිවනාදන් [1993] 1 ශ්‍රී ලංකා නී.වා. 123.
7. ජයන්ත ගුණසේකර එරෙහිව ජයතිස්ස ගුණසේකර සහ වෙනත් අය[2011] 1 ශ්‍රී ලංකා නී.වා. 284.
8. පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ යෝජිත පනත (ජනාධිපති නීතීඥ පාලිත කුමාරසිංහ මයා විසින් ඉදිරිපත් කරන ලදී).

1.4 සංවිධාන සටහන


ලේකම් (SL 1/2016- I වන ශ්‍රේණිය)
නියෝජ්‍ය ලේකම් (SL 1/2016- II වන ශ්‍රේණිය)
සහකාර ලේකම් (SL 1/2016 – III වන ශ්‍රේණිය)
සහකාර ලේකම් (SL 1/2016 – III වන ශ්‍රේණිය)
සහකාර ලේකම් (SL 1/2016 – III වන ශ්‍රේණිය)
සහකාර ලේකම් (SL 1/2016 – III වන ශ්‍රේණිය)
භාෂා පරිවර්තක (MN 6/2016)
ගිණුම් සහකාර (MN 4/2016)
පුස්තකාලාධිපති (MN3/2016)
ලඝු ලේඛක (MN 1/2016)
සංවර්ධන නිලධාරී (MN 4/2016)
සංවර්ධන නිලධාරී (MN 4/2016)
සංවර්ධන නිලධාරී (MN 4/2016)
සංවර්ධන නිලධාරී (MN 4/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
කළමනාකරණ සේවා නිලධාරී (MN 2/2016)
රියදුරු (PL 3/2016)
රියදුරු (PL 3/2016)
රියදුරු (PL 3/2016)
රියදුරු (PL 3/2016)
කාර්යාල සහයක (PL 1/2016)
කාර්යාල සහයක (PL 1/2016)
කාර්යාල සහයක (PL 1/2016)

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ.

1.6 අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ පළාත් සභාව යටතේ පවතින ආයතන අරමුදල්

මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ)	ව්‍යාපෘතියේ නම	මෙම දෙපාර්තමේන්තුව සඳහා අදාළ නොවේ.
ආ)	දායක නියෝජිතායතනය	
ඇ)	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - (රු.මි)	
ඈ)	ව්‍යාපෘති කාල සීමාව	

02. <u>පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම</u>

<u>විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක</u>

2023 වර්ෂයේ නීති කොමිෂන් සභාවේ නව සභාපති ලෙස ජනාධිපති නීතීඥ ඉක්‍රම් මොහොමඩ් මහතා අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පත් කරන ලදී .
ඒ අනුව 2023 නිති කොමිෂන් සභාවේ නව සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කටයුතු ආරම්භ කරන ලදී. නිති කොමිෂන් සභාව වෙත කැබිනට් මණ්ඩලය විසින් 2023/Cab Memo/J/L60 අංක දරන 2023 ජූනි 07 දින දරන කැබිනට් පත්‍රිකාව මගින් රටේ උද්ගතවී ඇති ආර්ථික අර්බුදය හමුවේ පැන නැගුනු ආර්ථික අභියෝග හමුවේ ජාත්‍යන්තර ආයෝජනයන් මෙරටට ආකර්ෂනය කර ගැනීමෙහිලා වඩාත් ශක්තිමත් බංකොලොත්භාවය පිළිබඳ නීතිමය රාමුවක් යෝජනා කිරීමට බලය පවරන ලදී. ඉතා සංකීර්ණ නීති විෂය පථයක් පිළිබඳ සංශෝධනයක් ලෝක බැංකුවෙන් ලබා දෙන ලද කාල පරිච්ඡේදයන් වලට අනුගත වෙමින් සිදු කිරීම ඉතා අභියෝගාත්මක වුවද 2023 දෙසැම්බර් මස වන විට බංකොලොත්භාවය පිළිබඳ නීතිමය සංශෝධන සහිත නීති කෙටුම්පත් ඉදිරිපත් කිරීමට හැකි වීම නීති කොමිෂන් සභාවේ කාර්ය සාධනමය වශයෙන් සඵලදායිව ඉලක්ක ගත අරමුණු වලට ප්‍රවිශ්ඨ වීමේ සාර්ථකත්වය පිළිබිඹු කරන්නක් විය.

තවද ගරු අධිකරණ අමාත්‍ය විජෙදාස රාජපක්ෂ මැතිතුමා විසින් නීති කොමිෂන් සභාව වෙත නීති නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා යොමු කරන ලද උපකෘත පාසල් හා පුහුණු පාසල් පිළිබඳ නීතිය සංශෝධනය පිළිබඳව ඉතා පුළුල් නීතිමය ගවේශණයන් මගින් ප්‍රශස්ත වාර්තාවක් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කිරීමට හැකි වීමද නීති කොමිෂන් සභාව විසින් ඉලක්ක ගත අරමුණු සඵලදායීව සපුරා ගැනීමක් විය.

තවද ගරු අධිකරණ ඇමතිතුමා විසින් නීති කොමිෂන් සභාව වෙත ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතට සංශෝධන යෝජනා ඉදිරිපත් කරන ලෙස යොමු කරන ලදී. ඒ අනුව නීති කොමිෂන් සභාව විසින් ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනත පිළිබඳ ප්‍රායෝගික නෛතික අභියෝග පිළිබඳව පුළුල්ව නීති කොමිෂන් සභා විද්වතුන් සමග සාකච්ඡා කරන ලදී. ඒ අනුව 2023 දෙසැම්බර් මස වන විට එම නීති සංශෝධනය සම්බන්ධවද ප්‍රශස්ත වාර්තාවක් ඉදිරිපත් කිරීමට නීති කොමිෂන් සභාවට හැකි විය.

2023 වසර නීති කොමිෂන් සභාව වෙත පවරන ලද සියළු අරමුණු ප්‍රශස්ථ ලෙස ලගා කර ගත් වසරක් වශයෙන් සනිටුහන් වන අතර නීති කොමිෂන් සභාවේ සඵලදායි ප්‍රගතිය අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ද ප්‍රසංශාවට ලක් වීම 2023 වර්ෂයේ නීති කොමිෂන් සභාවේ කාර්යසාධන සම්බන්ධව කැපී පෙනෙන වර්ධනීය තත්ත්වයක් විය.

මෙවැනි සාධනීය මට්ටමකට නීති කොමිෂන් සභාවේ කාර්ය සාධනය ඉහල නැංවීමෙහිලා කැපවීමෙන් තම වෘත්තීමය දැනුම හා කුසලතාවය ලබාදුන් නීති කොමිසන් සභාවේ නව සභාපතිතුමා ඇතුළු නීති කොමිෂන් සභාවේ සියළු සාමාජික මහත්ම මහත්මීන්ට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව වෙනුවෙන් මාගේ කෘතඥතාවය පල කරමි. තවද නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ අනෙකුත් මූල්‍ය සහ පරිපාලන කටයුතු ප්‍රශස්ත ලෙස පවත්වා ගනිමින් නීති කොමිෂන් සභාවේ කර්තව්‍යයන් සාර්ථක කර ගැනීමෙහිලා අවශ්‍ය සහාය ලබා දුන් දෙපාර්තමේන්තුවේ සියළු නිලධාරීන්ට ද මාගේ හද පිරි ප්‍රණාමය පිරිනමමි.

.....
සී.එස්.අබේසේකර
ලේකම්
නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

03. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	තත්‍ය 2023 රු.	- 2022 රු.	
ආදායම් ලැබීම්		-	-	
ආදායම් බදු	**1**	-	-	
දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසිඒ-1**
ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
ආදායම් නොවන ලැබීම්		-	-	
භාණ්ඩාගාර අග්‍රිම		14,353,000	16,548,430	**ඒසිඒ-3**
තැන්පතු		-	-	**ඒසිඒ-4**
අත්තිකාරම් ගිණුම්		973,738	869,105	**ඒසිඒ-5**
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		15,326,738	17,417,535	
මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**15,326,738**	**17,417,535**	
භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		45,093	27,015	
ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**15,281,645**	**17,390,520**	
අඩු කළා : වියදම්				
පුනරාවර්තන වියදම්			-	

		-		
වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	9,927,473	11,074,101	
අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	6,276,508	4,598,881	**ඒසිඒ-2(ii)**
සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	22,875	61,287	
පොළී ගෙවීම්	**8**	-	-	
වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**16,226,856**	**15,734,269**	
මූලධන වියදම්				
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	-	188,724	
මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	266,353	43,257	
ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
හැකියා වර්ධනය	**14**	36,000	-	
වෙනත් මූලධන වියදම්	**15**	-	-	
මුළු මූලධන වියදම් (උ)		**302,353**	**231,981**	
තැන්පතු ගෙවීම්		-	-	**ඒසිඒ-4**
අත්තිකාරම් ගෙවීම්		1,629,087	2,116,719	**ඒසිඒ-5**
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,629,087**	**2,116,719**	
මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		18,158,296	18,082,969	
දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(2,876,651)**	**(692,450)**	
අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(2,876,651)	(692,450)	**ඒසිඒ-7**
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				**ඒසිඒ-3**
		(2,876,651)	**(692,450)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023	තත්‍ය 2022
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	24,906,562	26,540,210
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	2,943,555	2,982,590
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**27,850,117**	**29,522,800**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,943,555	2,982,590
දේපළ පිරියත හා උපකරණ සංචිතය		24,906,562	26,540,210
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**27,850,117**	**29,522,800**

පිටු අංක...1.....සිට ...28..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .....29.... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2024/02/27	දිනය : 2024/02/26	දිනය : 2024/02/26
